**ශීර්ෂය 298 - මිනුම් ඒකක ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 298 - මිනුම් ඒකක ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මිනුම් ඒකක ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 මැයි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 ජූනි 28 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට මිනුම් ඒකක ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකිම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ වාර්තා මඟින් මා විසින් කර තිබුණු එම වාර්තාවේ 1.6.3 හි නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

### (අ) ආදායම් නොවන ලැබීම්

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ ආදායම් නොවන ලැබීම් යටතේ අත්තිකාරම් ලැබීම් රු. 7,225,245 ක් වූ අතර භාණ්ඩාගාර වගුව SA 52 අනුව අත්තිකාරම් ලැබීම් වටිනාකම රු. 7,674,867 ක් වූයෙන් රු. 449,622 ක් අඩුවෙන් දක්වා තිබුණි. | මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය අනුව අත්තිකාරම් ලැබීම් රු. 7,225,245 ක් වුවද භාණ්ඩාගාර වගුව SA 52 අනුව එහි වටිනාකම රු.7,674,867 ක් වන බැවින් රු.449,622 ක වෙනසක් ඇති බව. | නිවැරදිව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කල යුතුය. |
| (ii) | දෙපාර්තමේන්තුවේ ශේෂ පිරික්සුමට අනුව වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් රු. 8,118,607 ක් වුවද එය මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ රු. 1,174,028 ක් ලෙස සටහන් කිරීමෙන් රු. 6,944,579 ක වෙනසක් පැවතුණි. | මුදල් ප්‍රකාශය යනු සත්‍ය වශයෙන්ම මුදල් ලැබීම් හා ගෙවීම් දක්වන ලේඛනයක් බැවින් ගිණුම් සැකසීමේදි වැය ලෙජරයේ වැය විෂයන් සඳහා හර වී ඇති අගයන්ගෙන් හරස් සටහන් ගැලපීම් කර සත්‍ය වශයෙන්ම මුදල් ප්‍රවාහයේ වටිනාකම යොදා ගනිමින් සකස් කර ඇති බව. | නිවැරදිව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කල යුතුය. |

### (ආ) පුනරාවර්තන වියදම්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුවේ ශේෂ පිරික්සුමට අනුව පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම රු. 167,809,639 ක් වුවද එය මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ රු. 155,838,014 ක් ලෙස සටහන් කිරීමෙන් රු11,971,625 ක වෙනසක් පැවතුණි. | පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා ඇති වටිනාකම් ලබා ගත්තේ ද මුදලින් කළ සත්‍ය අගයන්ගෙන් පමණක් බව. | මාර්ගෝපදේශය ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කල යුතුය. |

**(ඇ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසැඳුම් ප්‍රකාශය**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(i)** | මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ ප්‍රධාන ලෙජර් වියදම් යටතේ අත්තිකාරම් ගෙවීම් රු. 10,933,565 ක් දක්වා තිබූ අතර භාණ්ඩාගාර වගුව SA 52 හි සඳහන් අත්තිකාරම් ගෙවීම් වටිනාකම රු.11,383,186 ක් වූයෙන් රු.449,621 ක් අඩුවෙන් දක්වා තිබුණි. | මාර්තු මාසයේදී 298012 ට හර විය යුතු රු. 171,048 ක් වැරදීමකින් 298011ට හර වී ඇති අතර සැප්තැම්බර් මාසයේදී 298012 ට ගෙවීමක් ලෙස සටහන් කළ යුතු රු. 278,138 ක් වැරදීමකින් 298012 ලැබීමක් ලෙස සටහන් වී ඇති බව හා නිවැරදි කර ඇති බව. | නිවැරදිව අත්තිකාරම් ගිණුම් පිළියෙළ කල යුතුය. |
| **(ii)** | දෙපාර්තමේන්තුවේ ශේෂ පිරික්සුමට අනුව අත්තිකාරම් අයකර ගැනීම් රු. 8,336,761 ක් වුවද එය මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ රු. 774,096 ක් ලෙස සටහන් කිරීමෙන් රු 7,562,665 ක වෙනසක් පැවතුණි. | මුදල් ප්‍රකාශය යනු සත්‍ය වශයෙන්ම මුදල් ලැබීම් හා ගෙවීම් දක්වන ලේඛනයක් බැවින් වැය ලේජරයේ වැය විෂයන් සඳහා හර වී ඇති අගයන්ගෙන් හරස් සටහන් ගැලපීම් කර සත්‍ය වශයෙන්ම මුදල් ප්‍රවාහයේ වටිනාකම යොදා ගනිමින් සකස් කර ඇති බව. | මාර්ගෝපදේශය ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කල යුතුය. |
| **(iii)** | දෙපාර්තමේන්තුවේ ඒකාබද්ධ ශේෂ පිරික්සුමට අනුව අත්තිකාරම් ගෙවීම් වටිනාකම රු. 11,661,324 ක් වුවද එය මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ රු. 9,323,631 ක් ලෙස සටහන් කිරීමෙන් රු 2,337,693 ක වෙනසක් පැවතුණි. | රු. 9,323,631 යනු 298011 සිදු වූ සත්‍ය මුදල් ප්‍රවාහය බැවින් එම අගය පමණක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයට ගලපන ලද බව. | -එම- |

**(ඈ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුව විසින් වැය ලෙජරය හා තැන්පතු ලෙජරය යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණි | ඉදිරියේදි නිවැරදි කරන බව | ලේඛන යාවත්කාලීනව පවත්වාගෙන යා යුතුය. |

## 2. මෙහෙයුම් සමාලෝචනය

### 2.1 කළමනාකරණ දුර්වලතා

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 දෙසැම්බර් 31 දිනට අත්තිකාරම් බී ගිණුමේ හිඟ හිටි නිලධාරින්ගේ ණය ශේෂ එකතුව රු.576,605 ක් වී තිබුණි. එම ශේෂය තුල වසර තුනකට වැඩි මිය ගිය නිලධාරියෙකුගෙන් අය විය යුතු රු. 147,429 ක ශේෂයක්ද, වැඩ තහනම් කරනු ලැබූ නිලධාරීන් තිදෙනෙකුගෙන් අය විය යුතු රු.217,570 ක ශේෂයක්ද, සේවය අතහැර ගිය නිලධාරියෙකුගෙන් අයවිය යුතු වසර 05 ක් ඉක්මවන ලද රු. 211,606 ක ශේෂයක්ද පැවතුණි. මිය ගිය නිලධාරියාගේ ණය ශේෂය සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 4:6 වගන්තිය අනුවද සේවය අතහැර ගිය සහ වැඩ තහනම් කරනු ලැබූ නිලධාරීන්ගේ ශේෂ සම්බන්ධයෙන් රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2020 ට අනුව වූ මාර්ගෝපදේශ අංක 01 හි (ඉ) ඡේදය ප්‍රකාරවද කටයුතු කර නොතිබුණි. | මිය ගිය නිලධාරියාගෙන් අය විය යුතු ශේෂය මරණ පාරිතෝෂිතය ගෙවනු ලබන අවස්ථාවේදි විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත ණය ශේෂය පියවීමට යවා ඇති අතර වැඩ තහනමට ලක් වී ඇති නිලධාරීන් සම්බන්ධයෙන් රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 හා මු:රෙ 113 පරිදි ඉදිරියේදි කටයුතු කරන බව. | ආයතන සංග්‍රහයේ විධිවිධාන හා රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2020 අනුව කටයුතු කල යුතුය. |

## 3. යහපාලනය

### 3.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 වගන්තියේ සඳහන් විධිවිධාන ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ කටයුතු ඉටු කිරීම පිණිස සුදුසු අභ්‍යන්තර විගණකවරයෙකු පත්කල යුතු වුවද 2021 සැප්තැම්බර් 06 දිනෙන් පසු අභ්‍යන්තර විගණකවරයෙකු පත්කර නොතිබුණි. | අභ්‍යන්තර විගණකවරයෙකු පත් කිරීමට රාජ්‍ය පරිපාලන ලේකම් වෙත දන්වා ඇති අතර, විගණකවරයෙකු නොමැති වුවද දෙපාර්තමේන්තු අභ්‍යන්තර විගණන අංශයේ කටයුතු සතුටුදායක අන්දමින් සිදුකරන බව | විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව අභ්යන්තර විගණකවරයෙකු පත්කිරීම කල යුතුය. |

**4.** **මානව සම්පත් කළමනාකරණය**

2023 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ අනුමත තත්‍ය හා පුරප්පාඩු සේවක සංඛ්‍යාව පහත පරිදි වේ.

| සේවක වර්ගය | අනුමත සංඛ්‍යාව | තත්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 19 | 09 | 10 |
| තෘතියීක මට්ටම | 30 | 02 | 28 |
| ද්විතියීක මට්ටම | 216 | 190 | 26 |
| ප්‍රාථමික මට්ටම | 103 | 81 | 22 |
| | **368** | **282** | **86** |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2023 දෙසැම්බර් 31 දිනට ජ්‍යෙෂ්ඨ මට්ටමේ අනුමත කාර්යමණ්ඩලය 19 ක් වූ අතර නියෝජ්‍ය අධ්‍යක්ෂ/සහකාර අධ්‍යක්ෂ - ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය තනතුරු 08 ක්ද, සහකාර අධ්‍යක්ෂ (පාලන) - ශ්‍රී ලංකා පරිපාලන සේවය තනතුරු 01 ක්ද, ගණකාධිකාරී (අභ්‍යන්තර විගණන) - ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය තනතුරු 01 ක්ද ඇතුළුව 10 ක් එනම් සියයට 53 ක් 2011 වසරේ සිට පුරප්පාඩුව පවතින බව නිරීක්ෂණය විය. | රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ප්‍රමාද දෝෂයක් හේතුවෙන් මෙම පුරප්පාඩු පිරවීමට නොහැකි වී ඇති අතර, ඒ පිළිබඳව විගණකාධිපති වෙත දන්වා යවා ඇති බව. | තනතුරු පුරප්පාඩු පිරවීමට කටයුතු කල යුතුය. |
| (ආ) | අනුමත තෘතියීක මට්ටමේ තනතුරු 30 ක් අතුරින් පරිපාලන නිලධාරී - කළමනාකරණ සේවා නිලධාරී සේවය (අධි ශ්‍රේණිය) තනතුරු 01 ක්ද සහකාර මිනුම් ඒකක ප්‍රමිත සේවා අධිකාරී - දෙපාර්තමේන්තුගත තනතුරු 04 ක්ද, ශ්‍රී ලංකා තාක්ෂණ සේවය (අධි ශ්‍රේණිය) තනතුරු 23 ක්ද ඇතුළුව 28 ක් එනම් සියයට 93 ක් පුරප්පාඩුව පැවතුණි. | මේ අතරින් තනතුරු 25 ක් සඳහා වන බඳවා ගැනීම් පටිපාටියේ අවසන් කෙටුම්පත 2024.03.22 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාවට යොමුකර ඇති අතර ඉතිරි තනතුරුවලින් 04 ක් සම්බන්ධයෙන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් නිශ්චිත උපදෙස් ලබා දී නොමැති බව. | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2023 දෙසැම්බර් 31 දිනට මුළු අනුමත තනතුරු සංඛ්‍යාවෙන් එනම් සියයට 23 ක් පුරප්පාඩුව පැවතුණු අතර එම පුරප්පාඩු සියල්ලම දෙපාර්තමේන්තුගත පුරප්පාඩු බව නිරීක්ෂණය විය. | මිනුම් විද්‍යා පරික්ෂක නිලධාරී (MN -04) තනතුරු 36 ක් උත්ශ්‍රේණිගත කිරීම සහ පුරප්පාඩු තනතුරු 20 ක් පිරවීම සඳහා ද මිනුම් විද්‍යා පරික්ෂක නිලධාරී තනතුරට සංවර්ධන නිලධාරීන් බඳවා ගැනීම සඳහා ද මිනුම් විද්‍යා පරික්ෂක නිලධාරී තනතුරට උපාධිධාරීන් කොන්ත්‍රාත් පදනමට බඳවා ගැනීම සඳහා ද කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට යවා ඇති බව. | -එම- |